## දළ ජාතික නිෂ්පාදිතය, ආදායම සහ වියදම

ශ්‍රී ලංකා ආර්ථිකයෙහි මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) 1981 වසරෙහි දී සියයට 5·8 කින් වැඩි වී ඇත. ස්ථාවර (1970) මිල ගණන් යටතේ මැන බැලූ කල්හි දළ දේශීය නිෂ්පාදිතය 1980 වසරේදී රුපියල් දශ ලක්ෂ 19,575 සිට 1981 වසරේදී රුපියල් දශලක්ෂ 20,706 දක්වා වැඩි වී තිබේ. කෙසේ වුවද, ස්ථාවර මිල ගණන් අනුව දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) 1981 දී වැඩිවී ඇත්තේ සියයට 4·2 කිනි. මෙය 1980 සියයට 5·6 සමග සසඳා බැලීම වටී. 1981 දී දළ දේශීය නිෂ්පාදිතය හා සසඳා බැලුවද, 1980 දළ ජාතික නිෂ්පාදිතය හා සසඳා බැලුවද, විදේශයනට ගෙවීමට සිදුවූ සාධක ආදායමෙහි සැහෙන වැඩිවීම, දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය අඩුවීම කෙරෙහි බලපා ඇත. උපයන ලද විදේශීය සාධක ආදායමෙන් විදේශයනට කළ ශුද්ධ ගෙවීම් 1980 දී රුපියල් දශලක්ෂ 119 (ස්ථාවර 1970 මිල ගණන් යටතේ) සිට 1981 දී තුන් ගුණයක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 438 ක් වී ඇත. මෙය, විදේශ වත්කම් මත ඉපැයූ පොළී ප්‍රමාණයෙහි අඩුවීම, විදේශ ණය ගැනීම් සඳහා ගෙවන ලද පොළී ප්‍රමාණයන් දෙගුණයකට වඩා වැඩිවීම සහ විදේශ ආයෝජනයන් වෙනුවෙන් ගෙවන ලද පොළී හා ලාභාංශ වැඩිවීම යන කරුණු සියල්ලෙහිම එක්වූ ප්‍රතිඵලයකි. මෙම විදේශයනට ගලාගිය ශුද්ධ සාධක ආදායම, 1981 දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන මට්ටම සියයට 1·6 කින් අඩුවීම කෙරෙහි බලපා ඇත.

පවත්නා සාධක වියදම් මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය 1981 වසර තුළදී සියයට 26·1 කින් වර්ධනය වී ඇත. 1980 දී රුපියල් දශලක්ෂ 62,246 ක්වූ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම 1981 දී රුපියල් දශලක්ෂ 78,506 දක්වා වැඩිවී තිබේ. 1980 දී රුපියල් දශලක්ෂ 432 ක සෘන වටිනාකමක් දැක්වූ විදේශීය ශුද්ධ සාධක ආදායම 1981 දී රුපියල් දශලක්ෂ 1,675 ක සෘන අගයක් දක්වා වැඩි වී ඇත. ඒ සඳහා කරන ලද ගැලපීම් සැලකිල්ලට ගත්විට 1981 වසරේදී පවත්නා සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සියයට 24·3 කින් වර්ධනය වී ඇත. ගම්‍ය මිල දර්ශකය අනුව දළ ජාතික නිෂ්පාදිතය ගැලපූ විට 1981 වසර තුළදී සමස්ත මිල මට්ටම සියයට 19 කින් පමණ වැඩිවූ බව පෙනේ.

1981 දී ජනගහන වර්ධන අනුපාතය සියයට 1·7 කින් පමණ වැඩි වේ යයි ඇස්තමේන්තු කර ඇත. මෙම ඇස්තමේන්තුගත ජනගහන වර්ධනය සමග ගැලපූ විට මූර්ත ඒකපුද්ගල ආදායම සියයට 2.4 කින් ඉහළ නැග තිබේ. පවත්නා මිල ගණන් අනුව මෙම වසරේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය රුපියල් 5,126 ක් හෙවත් එ. ජ. ඩොලර් 265 කි.

කෘෂිකාර්මික හා නිමැවුම් කර්මාන්ත යන අංශයන් 1981 වසරේදී මූලික වශයෙන් වර්ධනය වූ අංශ සේ සැලකිය හැකිය. පසුගිය අවුරුදු කිහිපය හා සසඳා බලන කල එය, ආර්ථිකයේ වර්ධන ආකාරය සැලකිය යුතු අන්දමින් වැඩි දියුණු කළ කරුණකි. 1981 දී කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය යන අංශයන්හි සියයට 6·9 ක වැඩිවීමක් වාර්තා කර ඇත. මෙම වසරේ දී නිමැවුම් කර්මාන්ත, පතල් හා උපයෝගිතා සේවාවන් හි වර්ධනය සියයට 5·4 ක් වශයෙන් සඳහන් වන අතර පසුගිය වසරේ එකී සියළුම අංශ යන් හි වර්ධන වේගය වූයේ සියයට 2·1 ක් වැනි සුළු ප්‍රමාණයකි. පසුගිය වසර කිහිපය තුළ ඉතා උසස් මට්ටමක වර්ධන අනුපාතයන් පෙන්නුම් කරන ලද, වෙළෙඳාම, ප්‍රවාහනය හා අනෙකුත් සේවා යන අංශවල 1981 දී සියයට 6·3 ක පහළ මට්ටමේ වර්ධන අනුපාතයක් පැවැතුණි. 1978 හා 1979 වර්ෂයන්හි ඉහළ මට්ටමක ගතික ස්වරූපයක් දැක්වූ තැනීම් කටයුතු අංශය 1980 දී සියයට 11 ක වඩාත් තාත්වික වර්ධන වේගයක් පෙන්නුම් කර ඇති අතර 1981 දී එකී අංශය ආන්තික වශයෙන් පහළ බැසීමක් වාර්තාගත කළේය.

කෘෂිකාර්මික අංශයට ගැනෙන තේ අනු–අංශය 1981 දී දළ දේශීය නිෂ්පාදිතයට දායක වූ ප්‍රමාණය සියයට 10 කින් පමණ වැඩි වී තිබේ. පසුගිය වසරේදී එය සියයට 7·5 ක අඩුවීමක් පෙන්නුම් කළේය. පොල් අනු–අංශයේ නිමැවුම ද සියයට 11·5 කින් වැඩි විය. එනිසා දළ දේශීය නිෂ්පාදිතයට ඉන් දයක වූ එකතු කළ වටිනාකම ද වැඩිවිය. 1981 වසරේ දී රබර් අනු–අංශය තව දුරටත් අඩාල තත්ත්වයේම පැවතුණි. මේ වසරේදී දළ දේශීය නිෂ්පාදිතයට එමගින් දයක වූ ප්‍රමාණය සියයට 6·0 ට වඩා වැඩි ප්‍රමාණයකින් අඩුවිය.

නිෂ්පාදනය සම්බන්ධව යම් යම් ප්‍රශ්න වලට මුහුණ දීමට සිදු වුවත්, මෑත වසර වලදී ඉතා ගතික මට්ටමක් පවත්වා ගැනීමට සමත් වූ වී අනු–අංශය මගින් 1981 දී දළ දේශීය නිෂ්පාදිතයට දයක වූ එකතු කළ වටිනාකම සියයට 3·6 කින් වැඩි කිරීමට හැකිවිය. 1981 දී අතිරේක ආහාර භෝග නිෂ්පාදිතය ද තව දුරටත් සැලකිය යුතු ලෙසින් වැඩි වූ බව වාර්තාගත

කරයි. රාජ්‍ය ද්‍රව සංස්ථාවේ වඩාත් අඩු නිෂ්පාදන පරිමාව විශාල වශයෙන් පිළිබිඹු කරමින් ද්‍රව ආදී වන ද්‍රව්‍ය අනු–අංශය මගින් දයක වූ ප්‍රමාණය 1981 දී ආන්තික වශයෙන් අඩු වී ඇත. ධීවර හා පශු සම්පත් අනු-අංශයට ඇතුළත් වන මාළු නිෂ්පාදනය සියයට 11 කින් ද, බිත්තර නිෂ්පාදනය සියයට 3 කින් ද, කිරි නිෂ්පාදනය සියයට 9 කින් ද වැඩි වී ඇත.

පතල් හා කැනීම් අංශයෙහි වර්ධනයේ තරමක අඩු වීමක් 1981 දී සිදු වී තිබේ. මැණික් ගැරීම හා මිනිරන් නිෂ්පාදනයේ අඩු වීමක් සිදු වී තිබෙන අතර ඉල්මනයිට් හා අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය නිෂ්පාදනයේ යම් වැඩිවීමක් පෙන්නුම් කරයි.

නිමැවුම් කර්මාන්ත අංශය 1981 දී සැළකිය යුතු වර්ධනයක් පෙන්වා ඇත. 1980 සියයට 9.8 ක අඩු වීම හා සංසන්දනය කර බලන විට, 1981 දී තේ හා පොල් නිෂ්පාදනයන් වැඩි වීම හේතුකොට ගෙන අපනයන සැකසුම් අනු–අංශය සියයට 7·6 ක වර්ධනයක් වාර්තා ගත කළේය. පෙර වසරට වඩා සැහෙන වර්ධනයක් කර්මාන්ත නිෂ්පාදන අනු- අංශය දක්විය. මසා නිම කළ ඇඳුම් පැලඳුම් කර්මාන්තයේ අපනයනයන්, 1981 වසරේදී සැළකිය යුතු ලෙස වැඩිවිය. කෙසේ වුවද, මෙම කර්මාන්ත නිෂ්පාදන අංශයේ නිමැවුම් මට්ටම කෙරෙහි වසර තුළ පැවැති විදුලි බල කපා හැරීම හා අළුත්වැඩියා කිරීම පිණිස ඛනිජ තෙල් පිරිපහදුව වසා දැමීමද බලපා ඇති බව දක්නට ඇත.

තැනීම් කටයුතු අංශයේ ගොඩනැගිලි තැනීම් කටයුතුවල ක්‍රියාකාරිත්වයේ සුළු පහළ බැසීමක් පැවතුණි. විශේෂයෙන් පෞද්ගලික අංශයෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වූ ඉල්ලුම 1981 වසරේදී සැහෙන පමණ අඩු විණ. වෙළෙඳපොලේ ලබා ගත හැකි වූ මුළු සිමෙන්ති ප්‍රමාණය සියයට 12 කින් පමණ අඩු වුවද, දේශීය වශයෙන් නිෂ්පාදිත සිමෙන්තිවල සුලභතාවය පසුගිය වසර තුළදී වැඩි විය. කෙසේ වුවද, මහවැලි සංවර්ධන වැඩ පිළිවෙල ආදී අනෙකුත් විවිධ තැනීම් කටයුතුවල ඉහළ මට්ටමක් නොකඩවා පැවතුණි. සමහර අනු–අංශ යන්හි සිදු වූ ආයෝජන ක්‍රියාකාරිත්වය හේතුකොට ගෙන විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා ආදියෙහි එකතු කළ වටිනාකම සැළකිය යුතු අන්දමින් වැඩි වී ඇත.

පසුගිය වසර කිහිපය තුළදී ප්‍රවාහනය, ගබඩා කිරීම් සහ විදුලි පණිවුඩ හුවමාරුව යන අංශය විශාල වශයෙන් වර්ධනය වී තිබුනි. ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෞද්ගලික අංශයේ ප්‍රවාහන කටයුතු ව්‍යාප්ත වීම සැහෙන මට්ටමකින් සිදුවීමයි. එහෙත් 1981 දී තරමක පසු බැස්මක් එම අංශය පෙන්නුම් කර ඇත. රාජ්‍ය අංශය සතුවන මධ්‍යම ගමනා ගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව එම ප්‍රවාහන සේවාවන් සැපයීමෙහි අඩු වීමක් දක්විය. තොග සහ සිල්ලර වෙළෙඳ අංශයද, සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කරයි. නිදහස් වෙළඳ ප්‍රතිපත්තියේ මූලික අවස්ථාවන්හිදී විශාල වශයෙන් දියුණුවක් දක්වන ලද ආනයන වෙළෙඳාම 1981 දී ඉතා සුළු වර්ධන මට්ටමක පැවතුණි.

බැංකු කටයුතු, රක්ෂණ හා නිශ්චල දේපල අංශයේ අළුත් සහ පැරණි ආයතනයන් අතර සැහෙන අන්දමක ව්‍යාප්ත වීමක් සහ වැඩ කටයුතුවල නැවත බෙද ගැනීමක් සිදුවී ඇත. පසුගිය වසර සමඟ සැසඳීමේදී මේ වසර තුළ නිවාස අයිතිය පිළිබඳ අංශයේ ව්‍යාප්ත වීම මඳ පමණකින් පහළ බැස තිබේ. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂා කටයුතු අංශයේ ප්‍රවනතාවයද එලෙසම පැවැති බව පෙනේ. හෝටල හා ආපනශාලා සම්බන්ධ කටයුතු, විනෝද කටයුතු සහ රූපවාහිනී වැනි නව මාදිලියේ ගුවන් විදුලි ප්‍රචාරක කටයුතුවල ව්‍යාප්ත වීම හේතුකොටගෙන කැපී පෙනෙන වර්ධන අනුපාතයක් සේවා අංශයේ තවදුරටත් දක්නට ලැබුණි.

ආර්ථිකයේ, ආංශීය ක්‍රියාකාරිත්වය විමසීමේදී 1981 ආර්ථික වර්ධනයෙහිලා කෘෂිකාර්මික අංශය මගින් සිදුවූ දයකත්වය ප්‍රධාන සාධකය වශයෙන් මතු වී පෙනේ. 1979 දී සියයට 5·7 හා 1980 සියයට 10·6 සමඟ සසඳා බලන කල්හි 1981 වර්ධනය උදෙසා එකී අංශය සියයට 35·5 කින් දයක වී ඇත. නිදහස් ආර්ථික ප්‍රතිපත්ති තවදුරටත් ගෙන යාම සඳහා මෙම අංශයෙන් සිදු වූ සේවාව හුවා දැක්වීම අනවශ්‍යය. වැවිලි කෘෂිකාර්මික භෝග සැකසීම ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ වැදගත් තැනක් ගැනීම නිසා කෘෂිකාර්මික අංශයද, නිමැවුම් කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීමෙහි ලා ප්‍රමාණවත් මට්ටමකින් දයක වී ඇත. 1980 දී සියයට 2 ක වර්ධනය හා සසඳා බලන කල 1981 දී සියයට 17 ක පමණ වර්ධනයක් නිමැවුම් කර්මාන්ත අංශයෙන් වාර්තා ගත වේ.

# දළ ජාතික නිෂ්පාදිතය




ශ්‍රී ලංකා මහ බැංකුව.

# කාර්මික සම්භවය අනුව දළ ජාතික නිෂ්පාදිතය

සථාවර (1970) සාධක වියදම් මිල අනුව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1·3 සංඛ්‍යා සටහන

## ස්ථාවර (1970) මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය 1979—1981

| අංශය | එකතු කළ වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | ද. ජා. නි. හි ප්‍රතිශතයක් වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම (රුපියල් දශ ලක්ෂ) | | | ද. ජා. නි. වැඩිවීමේ ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1979 | 1980* | 1981* | 1979 | 1980 | 1981 | 1979 | 1980 | 1981 | 1979 | 1980 | 1981 |
| 1. කෘෂිකර්මය, දුව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය .. .. .. | 4,622 | 4,766 | 5,097 | 25·1 | 24·5 | 25·1 | 90 | 144 | 331 | 8·2 | 14·0 | 40·8 |
| 1·1 කෘෂිකර්මය .. .. | 4,239 | 4,348 | 4,636 | 23·0 | 22·4 | 22·9 | 63 | 109 | 288 | 5·7 | 10·6 | 35·5 |
| 1·1·1 තේ .. .. | (412) | (381) | (419) | (2·2) | (2·0) | (2·1) | (14) | (−31) | (38) | (1·3) | (−3·0) | (4·7) |
| 1·1·2 රබර් .. .. | (223) | (194) | (181) | (1·2) | (1·0) | (0·9) | (−2) | (−29) | (−13) | (−0·2) | (−2·8) | (−1·6) |
| 1·1·3 පොල් .. .. | (519) | (462) | (515) | (2·8) | (2·4) | (2·5) | (31) | (−57) | (53) | (2·8) | (−5·6) | (6·5) |
| 1·1·4 වී .. .. | (1,132) | (1,267) | (1,313) | (6·2) | (6·5) | (6·5) | (16) | (135) | (46) | (1·4) | (13·1) | (5·7) |
| 1·1·5 අනෙකුත් .. .. | (1,953) | (2,044) | (2,208) | (10·6) | (10·5) | (10·9) | (4) | (91) | (164) | (0·4) | (8·9) | (20·2) |
| 1·2 දුව ආදී වන ද්‍රව්‍ය .. .. | 166 | 181 | 188 | 0·9 | 0·9 | 0·9 | 11 | 15 | 7 | 1·0 | 1·5 | 0·9 |
| 1·3 ධීවර කර්මාන්තය .. .. | 217 | 237 | 273 | 1·2 | 1·2 | 1·3 | 16 | 20 | 36 | 1·5 | 1·9 | 4·4 |
| 2. පතල් හා කැනීම් කටයුතු .. .. | 652 | 684 | 713 | 3·5 | 3·5 | 3·5 | 33 | 32 | 29 | 3·0 | 3·1 | 3·6 |
| 3. නිමැවුම් කර්මාන්ත .. .. | 2,659 | 2,681 | 2,820 | 14·4 | 13·8 | 13·9 | 118 | 22 | 139 | 10·7 | 2·1 | 17·1 |
| 3·1 අපනයන සැකසීම් .. .. | 877 | 791 | 851 | 4·7 | 4·1 | 4·2 | 37 | −86 | 60 | 3·3 | −8·4 | 7·4 |
| 3·2 කර්මාන්ත නිෂ්පාදන .. .. | 1,417 | 1,488 | 1,548 | 7·7 | 7·6 | 7·6 | 55 | 71 | 60 | 5·0 | 6·9 | 7·4 |
| 3·3 කුඩා හා අනෙකුත් කර්මාන්ත .. | 365 | 402 | 421 | 2·0 | 2·1 | 2·1 | 26 | 37 | 19 | 2·4 | 3·6 | 2·3 |
| 4. තැනීම් කටයුතු .. .. | 960 | 1,066 | 1,034 | 5·2 | 5·5 | 5·1 | 166 | 106 | −32 | 15·1 | 10·3 | −3·9 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා .. | 190 | 209 | 234 | 1·0 | 1·1 | 1·2 | 32 | 19 | 25 | 2·9 | 1·9 | 3·0 |
| 6. ප්‍රවාහනය හා පණිවුඩ හුවමාරුව .. | 1,716 | 1,838 | 1,957 | 9·4 | 9·4 | 9·7 | 109 | 122 | 119 | 9·9 | 11·9 | 14·7 |
| 7. තොග සහ සිල්ලර වෙළෙඳාම .. .. | 3,551 | 3,849 | 4,034 | 19·3 | 19·8 | 19·9 | 284 | 298 | 185 | 25·8 | 29·1 | 22·8 |
| 7·1 ආනයන .. .. | 864 | 985 | 1,005 | 4·7 | 5·1 | 5·0 | 162 | 121 | 20 | 14·7 | 11·8 | 2·5 |
| 7·2 අපනයන .. .. | 709 | 709 | 723 | 3·9 | 3·6 | 3·6 | 8 | — | 14 | 0·7 | — | 1·7 |
| 7·3 දේශීය .. .. .. | 1,978 | 2,155 | 2,306 | 10·7 | 11·1 | 11·3 | 114 | 177 | 151 | 10·4 | 17·3 | 18·6 |
| 8. බැංකු, රක්ෂණය හා නිශ්චල දේපල .. | 350 | 402 | 462 | 1·9 | 2·1 | 2·3 | 32 | 52 | 60 | 2·9 | 5·1 | 7·4 |
| 9. නිවාස අයිතිය.. .. .. | 518 | 549 | 579 | 2·8 | 2·8 | 2·9 | 19 | 31 | 30 | 1·7 | 3·0 | 3·7 |
| 10. රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂක කටයුතු .. | 905 | 959 | 997 | 4·9 | 4·9 | 4·9 | 51 | 54 | 38 | 4·6 | 5·3 | 4·6 |
| 11. සේවා (අන්තැනෙක සඳහන් නොවන) .. | 2,378 | 2,572 | 2,779 | 12·9 | 13·2 | 13·7 | 166 | 194 | 207 | 15·1 | 18·9 | 25·5 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය .. .. | 18,501 | 19,575 | 20,706 | 100·4 | 100·6 | 102·2 | 1,100 | 1,074 | 1,131 | 99·9 | 104·7 | 139·3 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම .. .. | −71 | −119 | −438 | −0·4 | −0·6 | −2·2 | 1 | −48 | −319 | 0·1 | −4·7 | −39·3 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය .. .. | 18,430 | 19,456 | 20,268 | 100·0 | 100·0 | 100·0 | 1,101 | 1,026 | 812 | 100·0 | 100·0 | 100·0 |

* තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1981 දී ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ජාත්‍යන්තර වෙළෙඳ අනුපාතයේ බලපෑම තවදුරටත් අයහපත් විය. අයහපත් වෙළෙඳ අනුපාතය නිසා ශ්‍රී ලංකාව සිය දළ ජාතික නිෂ්පාදිතයෙන් (ද.ජා.නි.) 1980 දී සියයට 6 ක අවාසියක්ද, 1981 දී සියයට 7 ක අවාසියක්ද පෙන්නුම් කළේය. 1980 දී 58 ක්වූ වෙළෙඳ අනුපාත දර්ශකය (1978 = 100) 1981 දී 46 දක්වා පහළ බැස ඇත. වෙළෙඳ අනුපාතයේ බලපෑම් සඳහා ගලපන ලද මූර්ත ජාතික ආදායම 1981 දී සියයට 3·4 කින් වැඩි වී ඇත. 1980 හා 1979 යන වර්ෂයන්හි එහි වැඩිවීම පිළිවෙලින් සියයට 3·7 ක් හා සියයට 2·6 ක් විය. මූර්ත ජාතික ආදායමේ ඇස්තමේන්තු, සංඛ්‍යා පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

1981 දී දළ ජාතික වියදම (ද.ජා.වි.) රුපියල් කෝටි 9,980 වශයෙන් ඇස්තමේන්තු කර ඇත. එය පසුගිය වසරට වඩා සියයට 22·4 ක වැඩිවීමක්ය. මුළු දළ ජාතික වියදමෙන් රුපියල් කෝටි 7,490 ක් පරිභෝජනය සඳහාද, රුපියල් කෝටි 2,490 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහාද වෙන් වී ඇත. 1981 දී දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 10·7 කින් වැඩි වී ඇති අතර දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 18·0 කින් වර්ධනය වී තිබේ. 1980 දී භාවිතයට නොගෙන තිබූ තොග මෙම වසරේදී පාවිච්චි කිරීම නිසා පසුව සඳහන් කරන ලද අංශයේ ඉහළ මට්ටමක වර්ධන අනුපාතය ඇති විය.

රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන සම්පාදනය 1981 දී සියයට 7·6 ක අඩු වීමක් පෙන්නුම් කළද, එකී අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 14.0 කින් වැඩි වී තිබේ. රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන සම්පාදනය 1981 දී සියයට 16·9 කින් වැඩි වී තිබෙන අතර ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වැඩි වී ඇත්තේ සියයට 19.0 කින්ය.

### 1·4 සංඛ්‍යා සටහන

### තෝරාගත් ආනයනිත ආයෝජන භාණ්ඩ

මි. ර. ගැ. වටිනාකම රු '000

| ශීර්ෂය | 1978 | 1979 | 1980 | 1981 |
|---|---|---|---|---|
| 1· බස් සහ මගී ප්‍රවාහන රථ .. | 29,231 | 412,054 | 421,207 | 338,430 |
| 2· ලොරි සහ වෑන් .. | 237.068 | 317,824 | 765,460 | 771,071 |
| 3· ඇන්ජිම සවි කරණ ලද චැසි .. | 407,482 | 282,538 | 235,296 | 59,317 |
| 4· ට්‍රැක්ටර් .. | 350,992 | 366,214 | 370,246 | 116,148 |
| 5· බුල්ඩෝසර් .. | 37,772 | 196,168 | 512,351 | 350,451 |
| 6· දුම්රිය ඇන්ජින් සහ අමතර කොටස් .. | 100,343 | 471,686 | 300,043 | 123,124 |
| 7· ගුවන් යානා සහ හෙලිකොප්ටර් .. | 47,721 | 33,221 | 3,725 | 760 |
| 8· මුහුදු යාත්‍රා ඇන්ජින් සහ පිටතින් සවිකරණ බෝට්ටු ඇන්ජින් .. | 63,486 | 78,208 | 107,334 | 73,952 |
| 9· නැව්, තෙල් නැව්, සහ ට්‍රෝලර් .. | 8,094 | 5,218 | 6,721 | 421 |
| 10· විදුලි උත්පාදන යන්ත්‍ර .. | 45,979 | 15,030 | 117,457 | 264,984 |
| 11· ලියවන පට්ටල්, ෂිලිං පට්ටල්, විදින යන්ත්‍ර ආදිය .. | 20,949 | 39,079 | 91,659 | 38,591 |

මූලය: ශ්‍රී ලංකා රේගුව

1981 දී ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය තරමක් අඩු වී තිබෙන අතර ප්‍රධාන ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සියයට 27·0 ක අඩු වීමක් පෙන්නුම් කරයි. ප්‍රධාන ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය පිළිබඳ විස්තර 1·4 සංඛ්‍යා සටහනෙහි ඇතුළත් වේ. 1981 දී නිරීක්ෂණය කරන ලද ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය විශාල පරිමාණයකින් අඩු වීම කෙරෙහි මෙතෙක් කල් බදු අය කිරීම සම්බන්ධයෙන් සලසන ලද එකවර ක්ෂය කිරීමේ පහසුකම 1981 වසර තුළදී ඉවත් කිරීම හේතු වී යැයි කිව හැකිය. සියයට 126 ක වැඩි වීමක් පෙන්නුම් කළ විදුලි බල උත්පාදන යන්ත්‍ර සහ ආන්තික වැඩි වීමක් පෙන්වූ ලොරි හා වෑන් රථ හැරුණු කොට අනෙකුත් සියළුම ප්‍රධාන ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සැලෙහන ප්‍රමාණයකින් අඩු විය. බස් රථ හා මගී ප්‍රවාහන වාහන ආනයනය සියයට 20 කින්ද, එන්ජිම සවි කරන ලද චැසි ආනයනය සියයට 75 කින් ද අඩු වී තිබේ. ට්‍රැක්ටර් හා බුල්ඩෝසර් ආනයනය පිළිවෙලින් සියයට 69 කින් හා සියයට 32 කින් අඩු වී ඇත.

පසුගිය වසර කිහිපය තුළදී තැනීම් කටයුතු අංශයේ වූ සීඝ්‍ර ප්‍රසාරණය 1981 වසරේදී හීනවූ බව පෙනෙන්නට ඇත. කෙසේ වුවද, වටිනාකම් අනුව බලනවිට මෙම අංශයේ ක්‍රියාකාරිත්වය සියයට 26·0 කින් පමණ වැඩි විය. මහවැලි සංවර්ධන වැඩ පිළිවෙලේ විවිධ තැනීම් කටයුතු 1980 දී වූ රුපියල් කෝටි 330 මට්ටමේම පැවතුණි. පසුගිය වසරෙහි වූ රුපියල් කෝටි 100 මට්ටමට සමානවම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තැනීම් කටයුතු මේ වස රේදී ද පවත්වා ගෙන යන ලදී.

ප්‍රාග්ධන සම්පාදනයෙහි විශාලතම වැඩි දියුණුවක් පෙන්නුම් කළේ නැවත වගා-කිරීම් හා ඉඩම් සංවර්ධන අංශයේ වැඩ කටයුතුවලය. රබර් හා පොල් යන අනු-අංශ හා සම්-බන්ධ නැවත වගා කිරීම් කටයුතුවල කැපී පෙනෙන සුළු වැඩි දියුණුවක් දක්නට තිබුණි.

**1·5 සංඛ්‍යා සටහන**

**ප්‍රාග්ධන වියදමෙහි ආනයනිත ප්‍රමාණය**

රු: දශලක්ෂ

| ශීර්ෂය | 1978 | 1979 | 1980* | 1981* |
|---|---|---|---|---|
| 1. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 8,521 | 13,246 | 20,845 | 24,528 |
| 2. ආනයනිත ආයෝජන භාණ්ඩ (මි.ර.ගැ.වටිනාකම) .. | 3,217 | 5,091 | 7,531 | 7,431 |
| 3 ආනයනිත ප්‍රමාණය .. | 37·8 | 38·4 | 36·1 | 30·3 |

* තාවකාලික ඇස්තමේන්තු

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගු ආනයනවල සාපේක්ෂ වැඩිවීමක් මෑත වසරවල දී පිළිබිඹු වේ. 1978 – 80 අතර කාලපරිච්ඡේදයේදී එහි සාමාන්‍ය වර්ධනය සියයට 37 ක් පමණ විය. කෙසේ වුවද, 1981 දී දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගු ආනයන ප්‍රමාණය සියයට 30 කින් පමණ පහළ බැස තිබේ.

**සම්පත්වල සුලභතාවය හා උපයෝජනය**

වෙළෙඳ මිල අනුව ගණනය කරන ලද 1981 ශ්‍රී ලංකා ආර්ථිකයෙහි මුළු සම්පත් ප්‍රමාණය රුපියල් කෝටි 12,550 ක් වශයෙන් දක්වේ. මෙය 1980 වසරේ පැවැති ප්‍රමාණයට වඩා සියයට 22 ක පමණ වැඩිවීමකි. 1980 වසරේ සියයට 35 හා සසඳා බලන කල, 1981 දී මුළු සම්පත් ප්‍රමාණයෙන් ආනයන කොටසට ගැනෙන ප්‍රමාණය සියයට 32·0 ක් විය. පසුගිය වසරේ සියයට 52 ක වැඩි වීම සමහ සලකා බලන කල, 1981 දී මුළු ආනයනයන්හි වටිනාකම වැඩි වීම සියයට 10·0 ක් පමණ වේ. වෙනත් ලෙසකින් කිවහොත් දේශීය නිෂ්පාදිතයෙන් ලබා ගත හැකි වූ සම්පත් ප්‍රමාණය 1980 දී වූ සියයට 65, 1981 දී සියයට 68 දක්වා වැඩි වී තිබේ.

සම්පත් උපයෝජනය ගැන සළකා බැලීමේදී විශාල ප්‍රමාණයක් පරිභෝජනය සඳහා කැප වී ඇත. වෙළෙඳ මිල අනුව ගණනය කරන ලද පරිභෝජන වියදම 1981 දී සියයට 27 කින් වැඩි වී තිබේ. එය 1980 දී සියයට 31 ක වැඩි වීමක් දක්වීය. 1980 දී සියයට 57 කින් වැඩි වූ ප්‍රාග්ධන සම්පාදන වියදම, 1981 දී සියයට 18 කින් වැඩි වී ඇත. කෙසේ වුවද, මීට ඉහතදී සඳහන් කළ පරිදි 1981 දී දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වඩා වේගවත් අයුරින් වැඩි වී තිබේ. සම්පත් සුලභතාවය හා උපයෝජනය පිළිබඳ විස්තර 1.6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

මූර්ත වශයෙන් මැන බලන කල රටෙහි වූ මුළු සම්පත් ප්‍රමාණය 1981 දී සියයට 5·3 කින් වැඩිවීමක් පෙන්වයි. ලබාගත හැකි වූ සම්පත් ප්‍රමාණය 1979 දී සියයට 11 ක් වශයෙන්ද, 1980 දී සියයට 8.3 ක් වශයෙන්ද වඩා වේගවත් අන්දමක වැඩි වීමක් දක්වයි. දේශීය මාර්ගයන් ගෙන් ලබා ගත හැකි වූ සම්පත් ප්‍රමාණය 1980 වසරේ මට්ටමෙන්ම පැවැති අතර ආනයන පරිමාවේ වර්ධන අනුපාතය අඩු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1981 දී ලබා ගත හැකි වූ සම්පත්

## 1·6 සංඛ්‍යා සටහන

## සම්පත් සංයුතිය සහ උපයෝගී කරගත් ආකාරය 1978 - 1981

| වර්ගය | වර්තන වෙළෙඳ මිල අනුව (රු. දශ ලක්ෂ) | | | | 1978 මිල අනුව | | | | | | | | ප්‍රතිශතක වර්ධනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980* | 1981* | 1978 | | 1979 | | 1980 | | 1981 | | 1978 ට වඩා 1979 | 1979 ට වඩා 1980 | 1980 ට වඩා 1981 |
| | | | | | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | | | |
| 1. මුළු සම්පත් .. .. | 59,537 | 76,356 | 102,983 | 125,487 | 59,537 | 100 | 66,105 | 100 | 71,600 | 100 | 75,361 | 100 | 11·0 | 8·3 | 5·3 |
| 1·1 වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය .. .. | 42,665 | 52,387 | 66,527 | 85,405 | 42,665 | 72 | 45,353 | 69 | 47,983 | 67 | 50,766 | 67 | 6·3 | 5·8 | 5·8 |
| 1·2 භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයන .. .. | 16,872 | 23,969 | 36,456 | 40,082 | 16,872 | 28 | 20,752 | 31 | 23,617 | 33 | 24,595 | 33 | 23·0 | 13·8 | 4·1 |
| 2. උපයෝගීකරණය .. .. | 59,537 | 76,356 | 102,983 | 125,487 | 59,537 | 100 | 66,105 | 100 | 71,600 | 100 | 75,361 | 100 | 11·0 | 8·3 | 5·3 |
| 2·1 පරිභෝජනය .. .. | 36,148 | 45,169 | 59,084 | 74,927 | 36,148 | 61 | 40,430 | 61 | 43,616 | 61 | 46,887 | 62 | 11·8 | 7·9 | 7·5 |
| 2·2 ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. .. | 8,521 | 13,246 | 20,845 | 24,528 | 8,521 | 14 | 10,568 | 16 | 12,719 | 18 | 13,236 | 18 | 24·0 | 20·4 | 4·1 |
| 2·2·1 රජය .. .. | (3,077) | (3,809) | (4,709) | (5,375) | (3,077) | (5) | (3,630) | (5) | (3,804) | (5) | (3,842) | (5) | 18·0 | 4·8 | 1·0 |
| 2·2·2 රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල .. | (2,056) | (9,437) | (16,136) | (19,153) | (2,056) | (3) | (6,938) | (11) | (8,915) | (13) | (9,394) | (13) | 27·4 | 28·5 | 5·4 |
| 2·2·3 පෞද්ගලික අංශය .. | (3,388) | | | | (3,388) | (6) | | | | | | | | | |
| 2·3 භාණ්ඩ තොග .. .. | 33 | 281 | 1,620 | 331 | 33 | — | 124 | — | 587 | 1 | 120 | — | — | — | — |
| 2·4 භාණ්ඩ සහ සාධක නොවන සේවා අපනයන .. .. | 14,835 | 17,660 | 21,434 | 25,701 | 14,835 | 25 | 14,983 | 23 | 14,678 | 21 | 15,118 | 20 | 1·0 | – 2·0 | 3·0 |

* තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රමාණය අඩු විය. 1979 දී සියයට 23 හා 1980 දී සියයට 13·8 සමඟ සසඳා බලන කල්හී, 1981 දී ආනයන පරිමාව වැඩි වූයේ සියයට 4·1 කිනි. 1980 දී සියයට 7·9 කින් වැඩි වූ පරිභෝජනය 1981 දී සියයට 7·5 කින් වැඩි විය. පසුගිය වසරේ සියයට 20·4 හා සසඳා බලන විට මෙම වසරේදී ආයෝජනය සියයට 4·1 කින් වැඩිවී තිබේ.

මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 62 ක් පරිභෝජනය සඳහා උපයෝගී කර තිබෙන අතර, ප්‍රාග්ධන සම්පාදනය සඳහා උපයෝගී කර ඇත්තේ සියයට 18 ක් පමණකි. ප්‍රාග්ධන සම්පාදනයෙන් සියයට 29 ක් පමණ ප්‍රමාණයක් රාජ්‍ය අංශය හා සම්බන්ධ වූ අතර, ඉතිරි සියයට 71 සඳහා පෞද්ගලික අංශය හා රජයේ සංස්ථා සම්බන්ධ විය. මූර්ත වශයෙන් බලන කල පසුගිය වසරේ සියයට 2 ක අඩු වීමක් පෙන්නුම් කළ, අපනයනයන් මෙම වසරේදී සියයට 3 ක වැඩි වීමක් පෙන්වීය.

1980 රුපියල් කෝටි 740 ක් වූ දේශීය ඉතිරි කිරීම, 1981 දී රුපියල් කෝටි 1050 ක් විය. එය පෙර වසරට වඩා රුපියල් කෝටි 300 ක වැඩි වීමකි. කෙසේ වුවද, වැදගත් අංශයක් ලෙස වැඩෙමින් එන පෞද්ගලික සංක්‍රාම ඉපැයුම් සඳහා ගලපා සැකසූ කල්හී 1981 දී මුළු ඉතිරි කිරීම් රුපියල් කෝටි 460 කින් වැඩි වී ඇත. මෙම පෞද්ගලික සංක්‍රාම ඉපැයුම් ප්‍රමාණවත් ලෙස වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1980 සියයට 14·6 කින් වැඩි වූ දළ ඉතිරි කිරීම් අනුපාතය 1981 දී සියයට 16·8 කින් වැඩි වී තිබේ.

**1·7 සංඛ්‍යා සටහන**

**දේශීය ඉතුරුම්**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1979 | 1980* | 1981* |
|---|---|---|---|
| 1· වෙළෙඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය .. .. | 52,387 | 66,527 | 85,405 |
| 2· භාණ්ඩ හා සාධක නොවන සේවාවන්හි ශුද්ධ ආනයනය .. .. .. | 6,309 | 15,022 | 14,381 |
| 3· ආයෝජන .. .. .. | 13,527 | 22,465 | 24,859 |
| 4· දේශීය ඉතුරුම් (3—2) .. .. .. | 7,218 | 7,443 | 10,478 |
| 5· දේශීය ඉතුරුම් අනුපාතය (අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) .. .. .. | 13·8 | 11·2 | 12·3 |
| 6· ශුද්ධ පෞද්ගලික පැවරුම් .. .. .. | 754 | 2,260 | 3,849 |
| 7· ඉතුරුම් (4+6) .. .. .. | 7,972 | 9,703 | 14,327 |
| 8· ඉතුරුම් අනුපාතය .. .. .. | 15·2 | 14·6 | 16·8 |

* තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## කෘෂිකර්මය

දෙවසරක පසුගාමී ක්‍රියාකාරිත්වයකින් මිදී, 1981 වර්ෂයේ දී, කෘෂිකාර්මික අංශය දිරිගන්වන සුළු වර්ධනයක් පෙන්වා ඇත. සමස්තයක් වශයෙන් ගෙන බලන කල, මෙම අංශයේ සියයට 6·9 ක වර්ධන අනුපාතිකයක් වාර්තා වී ඇති අතර, තේ, පොල් සහ වී වගා අංශයන්හි සතුටුදායක නිපැයුම මෙයට බොහෝ දුරට හේතු විය. 1980 වර්ෂයේ වර්ධන අනුපාතිකය සියයට 3·1 ක් විය.

තේ නිෂ්පාදනය 1980 වර්ෂයේ පැවති පහත් මට්ටමෙන් මිදී සියයට 10 ක වැඩිවීමක් වාර්තා කළේය. පොල් නිෂ්පාදනය, ඉකුත් වසරේ වාර්තා වූ මට්ටමට වඩා සියයට 11 කින් වැඩි විය. වර්ෂය තුළදී සුළු අපනයන භෝගයන්හි අපනයන ක්‍රියාකාරිත්වය අනුව බලන කල, පසුගිය වසර කිහිපය තුළ පෙන්වූ දුර්වල තත්ත්වයෙන් මගහැරී නිෂ්පාදනය වැඩි වී ඇති බව පෙනුණි. කෙසේ වුවද, රබර් නිෂ්පාදනය සියයට 7 කින් පමණ අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, කිරි කපන බිම් ප්‍රමාණය සහ සාමාන්‍ය පලදාව අඩුවීමය. දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයකම නියඟ තත්ත්වයක් පැවතියද, ක්ෂේත්‍ර භෝග අතුරෙන්, වී නිෂ්පාදනයේ සියයට 4·6 ක වැඩි වීමක් වාර්තා විය. 1980 වර්ෂය තුළදී සුළු දියුණුවක් පෙන්වූ අතුරු

37707